# කැළණිය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව

**FACULTY OF MEDICINE, UNIVERSITY OF KELANIYA, SRI LANKA**

**P.O. Box 6, Thalagolla Road, Ragama, Sri Lanka**

Tel: 011-2961000, 011-2961124,011-2961163, Fax: 011-2958337


කායව්‍යවච්ඡේද අංශය

හිතවත් මහත්මයාණෙනි/මහත්මියනි,

## <u>වෛද්‍ය පීඨයට මෘත ශරීර පරිත්‍යාග කිරීම</u>

ඔබගේ ශරීරය මරණින් පසු අධ්‍යයන කටයුතු සහ වෛද්‍ය පර්යේෂණ සඳහා භාරදීමට ඔබ විසින් ගෙන ඇති තීරණය පිළිබඳව ස්තූතිවන්ත වෙමු. මෘත ශරීරයක් වෛද්‍ය පීඨය වෙත භාරදීම සඳහා භාරකරුවන්ගේ එකඟතාවයද අවශ්‍ය වන අතර ඔවුන් විසින් අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය පහත දක්වා ඇත.

1. මෘත ශරීරය භාරදීමට දිනය සහ වේලාව වෛද්‍ය පීඨ කායව්‍යවච්ඡේද අංශය වෙත පැමිණ හෝ දුරකථනයෙන් අමතා (2961163, 2961000, 2961124, 2958337 ) නියම කරගත යුතුය. මෘත ශරීර භාරගනු ලබන්නේ සතියේ දිනවල (රජයේ නිවාඩු දින හැර)පෙ.ව. 10.00 සිට ප.ව. 3.00 දක්වා පමණි. සෙනසුරාදා පෙ.ව. 10.30ට පසු හා ඉරිදා දිනයන්හි මෘත ශරීර භාරගනු නොලැබේ .

2. මෘත ශරීරයක් භාරදීමට පැමිණෙන නෑනැත්තා තමාගේ නම, ලිපිනය හා ජාතික හැඳුනුම් පත් අංකය ඉදිරිපත් කළ යුතු අතර මරණ සහතිකයේ මුල් පිටපත සහ ඡායා පිටපතක්ද අප වෙත ඉදිරිපත් කල යුතුවේ.

3 මරණය සිදුවී පැය දොලහක් ඇතුලත දේහය භාරදෙනු ලබන්නේ නම් ස්වාරක්ෂණය(එම්බාම්) කිරීම අනවශයය. සම්පූර්ණයෙන් ස්වාරක්ෂණය කරන ලද දේහයක් නම් පැය 48ක් ඇතුලත භාරදිය යුතුය. ස්වාරක්ෂණය කරන්නේ නම් එය කල යුත්තේ <u>ශරීරයේ වෙනත් කිසිම අවයවයක් කපා ඉවත් නොකර</u>, කලවා පෙදෙසෙහි ඉහල කොටසේ ඉදිරියෙන් පිහිටි ඌර්ව ධමනිය තුලින් ස්වාරක්ෂණ තරලය විදීමෙන් පමනි. ඔබ භාරදෙන දේහය වෛද්‍ය පීඨ අධ්‍යයන කටයුතු සඳහා භාවිතා කරන හෙයින් ඒ පිළිබඳව ස්වාරක්ශණය කරන නෑනැත්තාව හොඳින් දැනුවත් කළ යුතුය.

4 භාරදෙන මෘතදේහය අධ්‍යයන කටයුතු සඳහා සුදුසු තත්වයක නැත්නම් හෝ නරක් වෙමින් පවතින්නේ නම් එය ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය වෛද්‍ය පීඨය සතුව ඇති බව කරුණාවෙන් සලකන්න. එවැනි අවස්ථාවකදී දේහය පීඨයෙන් වහාම ඉවත් කර ගැනීමේ වගකීම සමීප ඥාතීන් වෙත පැවරෙන බව කරුණාවෙන් සලකන්න.

5 ආගමික වතාවත් නිවසේදීම සිදුකර මෘත දේහය භාරදීමට රැගෙන ආ යුතුය. වෛද්‍ය පීඨය තුලදී ආගමික වතාවත් කිරීමට ඉඩ ලබාදිය නොහැක. මෘත දේහය ප්‍රවාහනය කිරීම සඳහා පහසුකම් පීඨය මගින් නොසැපයෙන අතර ආරක්ෂක හේතු මත දේහය භාරදීමට වෛද්‍ය පීඨයට ඇතුලු වීමට අවසර දෙනු ලබන්නේ පුද්ගලයින් 5 දෙනකුට පමණක් (මල්ශාලා නියෝජිතයන් ඇතුලුව) බව සලකන්න.

6 පශ්චාත් මරණ පරීක්ෂණයකට බඳුන් කල හෝ විශාල ශල්‍ය කර්මයකට බඳුන් වූ හෝ දේහ භාරගත නොහැකි වුවද අක්ෂිදාන සංගමයට ඇස් ප්‍රදානය කරනු ලැබූ දේහයන් භාරගැනීම සිදුකරන බව කරුණාවෙන් සලකන්න,

7 මිනීපෙට්ටිය සහ අනෙකුත් සැරසිලි වෛද්‍ය පීඨයට භාරගත නොහැකි බවන් දේහය භාර දීමෙන් අනතුරුව ඒවා නැවත රැගෙන යන ලෙස මල් ශාලාවට උපදෙස් දෙන මෙන් කරුණාවෙන් දන්වමි.

8 භාරගත් මෘත ශරීර පහත සඳහන් කටයුතු සඳහා යොදාගැනේ.
වෛද්‍ය පීඨ සිසුන්ගේ අධ්‍යයන කටයුතු, වෛද්‍ය පීඨයේ වෛද්‍ය ප්‍රදර්ශණය, වෛද්‍ය පර්යේෂණ, ප්‍රජා අධ්‍යාපනය සහ පාසැල් සිසුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා .

අංශප්‍රධාන, කායව්‍යවච්ඡේද අංශය,

---

සම්පූර්ණ නම.......................................................................................................

ලිපිනය................................................................................................................

භාරකරු වෙත කරනු ලබන ප්‍රකාශය.

.........................................................................වන(ජා.හැ.අංකය.................................................) මාගේ ශරීරය වෛද්‍ය පීඨ සිසුන්ගේ අධ්‍යයන කටයුතු, වෛද්‍ය පීඨයේ වෛද්‍ය ප්‍රදර්ශණය, වෛද්‍ය පර්යේෂණ, ප්‍රජා අධ්‍යාපනය සහ පාසැල් සිසුන්ගේ අධ්‍යාපනය කටයුතු සඳහා භාර දීමට මෙයින් කැමැත්ත ප්‍රකාශ කරමි.

.........................................................................

අත්සන

**මෙම පත්‍රිකාව පුරවා ඥාතියෙකුට ලබා දෙන්න, නැතිනම් පෙනෙන තැනක එල්ලා තබන්න. එය වෛද්‍ය පීඨය වෙත ආපසු එවීම අනවශ්‍යය.**